**ශීර්ෂය - 149  කර්මාන්ත අමාත්‍යාංශය**

**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය -149 කර්මාන්ත අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ඔක්තෝබර් 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් ඉදිරිපත් කර තිබුණු නිර්දේශයන්ගෙන් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීමේ 1.6.1(ආ) ඡේදයේ දැක්වෙන නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාථමික කර්මාන්ත අංශය විසින් භාවිතා කරනු ලබන රු.මිලියන 102.9 ක් වටිනා වාහන 11 ක් හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය විසින් භාවිතා කරනු ලබන රු.මිලියන 161.9 වටිනා වාහන 16 ක් විවිධ අමාත්‍යාංශවලින් ලැබී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට එම වාහන අමාත්‍යාංශයට පවරාගෙන වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි. | විටින් විට අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වීම නිසා ස්ථාවරවත්වයක් නොතිබුන බැවින් පවරා ගැනීමක් නොකල අතර මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | වාහනවල අයිතිය පවරා ගැනීමට හා වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම එහි මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කල යුතු වුවත් කර්මාන්ත සංවර්ධන අංශයෙන් ලද තොරතුරුවලට අනුව 1996 වර්ෂයේ සිට කර්මාන්තපුර 16 ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 13 ක, කර්මාන්තශාලා 03 ක හා කාර්යාල නිවාස/සේවා ගොඩනැගිලි 02 ක වටිනාකම වූ රු.මිලියන 544.94 ක් 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් කර්මාන්තපුර ලෙස අදාල අමාත්‍ය මණ්ඩල තීරණ මගින් ප්‍රකාශයට පත් කර පිහිටුවනු ලැබූ අතර එම ඉඩම් වල හිමිකාරත්වය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ප්‍රාදේශීය ලේකම්, මහවැලි අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන සතු බව. ඒ අනුව භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරියේදී මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමට නියමිත බව. | ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ACA 6 අකෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට රු.719,025,340ක් වූ මගී වාහන වටිනාකමට අදාලව විස්තරාත්මක උපලේඛණයක් ඉදිරිපත් කර නොතිබුණි. | ACA 06 ආකෘතියේ දක්වා ඇති මගී වාහන වටිනාකම වූ රු.719,025,340 සඳහා විස්තරාත්මක ලේඛණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ CIGAS පරිගණක දත්ත පද්ධතිය මගින් ලබා ගැනීමට නොහැකි වූ බව. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර පරිගණක වැඩසටහනෙහි අවශ්‍ය නිවැරදි කිරීම් කර තොරතුරු ඉදිරිපත් කරන බව. | ගිණුම් ශේෂවලට අදාලව යාවත්කාලීන ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයන් 13කට හා පුනරාවර්තන වැය විෂයයන් 19 කට අදාලව සලසන ලද රු.1,022,600,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.252,453,771ක් උපයෝජනය කර රු.770,146,229 ක ඉතිරියක් පැවතුණි. එය වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | අමාත්‍යාංශ ලේකම් විසින් අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම සියයට 15 කින් ඉතිරි කිරීම සඳහා ජනාධිපති ලේකම් සමග අත්සන් කරන ලද කාර්යසාධන ගිවිසුම හේතුවෙන්, අමාත්‍ය කාර්යාලයට අදාල වියදම් මෙම අමාත්‍යාංශය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය අතර බෙදී යාම හේතුවෙන් හා වියදම් කළමනාකරණයට අනුගත වෙමින් අයවැය චක්‍රලේඛ අංක 1/2023 පරිදි සියයට 6 කින් පුනරාවර්තන වියදම් කපා හැරීමද අදාල ඉතිරිවීම් සඳහා හේතු වී ඇති බව. | වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා වියදම් අවම වන පරිදි පිළියෙල කළ යුතු අතර වෙන් කල මුදල උපරිම ඵලදායි ලෙස භාවිතා කරමින් සැලසුම්ගත කාර්යයන් ඉටු කරගත යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් 6කට හා පුනරාවර්තන වැය විෂයයන් 3කට අදාලව සලසන ලද රු.5,400,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2022 ප්‍රකාරව අත්‍යාවශ්‍යම වියදම් පමණක් දැරීමට කටයුතු කිරීම, අමාත්‍ය කාර්යාලය සඳහා වැවිලි අමාත්‍යාංශයෙන් වියදම් දැරීම නිසා ඒ සඳහා වෙන් කර තිබූ අයවැය ප්‍රතිපාදනවලින් වියදම් දැරීමක් අවශ්‍ය නොවීම මෙම වැය විෂයයන්හි මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වීමට හේතු වී ඇති බව. | වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව හා වියදම් අවම වන පරිදි පිළියෙල කළ යුතු අතර වෙන් කල මුදල් උපරිම ඵලදායි ලෙස භාවිතා කරමින් සැලසුම්ගත කාර්යයන් ඉටු කරගත යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයට අදාලව 2024 වර්ෂයේ වැය විෂයයන් 17 කට අදාලව සිදුකල රු.2,457,642 ක් වූ ගෙවීම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ ගෙවූ වැය විෂයයන් 17 කට අදාල රු. 2,457,642ක වටිනාකම 2023 වාර්ෂික ගිණුම්වල තව දුරටත් බැරකම් ලෙස දැක්වීමේ අවශ්‍යතාවයක් නොමැති බව. | වර්ෂයට අදාල සියලු බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වීමට කටයුතු |

කළ යුතුය.

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීන්ෂණයන් කරනු ලැබේ.

| | | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| **(i)** | මුදල් රෙගුලාසි 37 | ගෙවීම් අනුමත කිරීමේදී සේවාව, වැඩ හෝ සැපයුම් නිසිපරිදි සම්පූර්ණ කෙරුණු බවට සෑහිමකට පත්ව ගෙවීම් අනුමත කළ යුතු වුවද දේශීය රතු මැටි උළු නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමේ ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට 2016 වර්ෂයේදී රු.4,298,224 ක් ගෙවා තිබුණ ද එහි සත්‍ය වියදම රු.3,032,462ක් විය. ඒ අනුව ගෙවීම් අනුමත කිරීමේදී සම්පූර්ණ කරන ලද වැඩ ප්‍රමාණය ඉක්මවා රු.1,265,762ක් ගෙවීම් කර තිබුණි. | | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග වූ එකඟතාවයට අනුව ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට මෙම ගෙවීම සිදු කළ ද, කර්මාන්ත ආයතන කිහිපයක් විවිධ හේතු මත අතරමඟ දී ව්‍යාපෘතියෙන් ඉවත් වූ බැවින් මෙම මුදල ඉතිරි වූ බව. මෙම මුදල යොදා ගෙන මේ හා සමාන ව්‍යාපෘතියක් නැවත ක්‍රියාත්මක කළ ද රට තුල ඉදිකිරීම් අංශය පසුබෑමකට ලක්වීම නිසා මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැඩ, සැපයුම හෝ සේවාව නිසිපරිදි ඉටුකර ඇති බවට සෑහිමකට පත්ව ගෙවීම් කළ යුතුය. වැඩිපුර ගෙවූ මුදල ආපසු ලබා ගැනීමට හෝ වෙනත් ව්‍යාපෘතියක වියදමට හිලව් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 104(4) | අලාභහානියක් සම්බන්ධයෙන් එය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, වාහන 2කට අදාලව අනතුරු සිදු වී තුන්මසකට වැඩි කාලයක් ගත වී තිබුණද පූර්ණ වාර්තා ඉදිරිපත් කර | | පූර්ණ වාර්තා පිළියෙල කර ඇති අතර රක්ෂණ වන්දි ලබා ගැනීමේ ගැටළුකාරී තත්වයක් හේතුවෙන් අයකර ගන්නා ලද මුදල සඳහන් කිරීමට නොහැකි වීම මත පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනතුරු හානි සම්බන්ධයෙන්කට යුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණි. | | |
| (iii) | මුදල් රෙගුලාසි 571(3) | අදාල විස්තර ලැබෙන තෙක් තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබා ගෙන ඇති මුදල් අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කිරීම හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීම කල යුතු වුවත් අමාත්‍යාංශය විසින් ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා තාවකාලික රුඳවුම් ගිණුමේ තැන්පත් කර ඇති රු.2,942,500 ක් වූ තැන්පතු මුදල් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | තැන්පතු ගිණුම්වල ඇති මුදල් සම්බන්ධයෙන් අදාල අංශ සමඟ කටයුතු කොට නිරවුල් කිරීමට කටයුතු කරන බව. | තැන්පතු ගිණුම්වල රඳවාගෙන ඇති මුදල් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 ජනවාරි 16 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 08/2016 හි ඇමුණුම I | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගතව පිළියෙල කර නොතිබුණි. | සමස්ථ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සැකසීමට කටයුතු කරන ලෙස අදාල අංශ දැනුවත් කළ බව. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 වන විට කර්මාන්තපුර 17 කට අදාලව ඉඩම් කට්ටි 89 ක් (අක්කර 109.5ක්) කර්මාන්තකරුවන් වෙත වෙන් කර තිබුණද ඉඩම් ලබා නොදීම හේතුවෙන් එම ඉඩම් නිශ්කාර්යව පැවතුණි. | නව කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීමට ආයෝජකයන් ඉදිරිපත් නොවීම, පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් කර්මාන්ත සඳහා ඉදිරිපත් වූ ඉඩම් ඉල්ලීම් අඩුවීම මත ඉඩම් හිස්ව පවතින බව. | සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත ආරම්භ කරවීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්තපුර 16 කට අදාලව කර්මාන්තකරුවන් 130 ක් විසින් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති වාර්තා අනුව උත්පාදනය කිරීමට අපේක්ෂා කළ රැකියා ප්‍රමාණය 10475 | රටෙහි පැවති කොරෝනා වසංගත තත්වය, ආර්ථික අර්බුදය, ඉන්ධන හිඟකම, අමුද්‍රව්‍ය මෙරටට ගෙන්වා | කර්මාන්තකරුවන් විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේදී |

| | | |
|---|---|---|
| ක් වුවද වර්තමානයේ උත්පාදනය කර ඇති රැකියා ප්‍රමාණය 1504 ක් වූයෙන් අපේක්ෂිත මට්ටම කරා ලඟා වීමේ ප්‍රතිශතය සියයට 14 ක් විය. | ගැනීමට නොහැකි වීම, ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි පසුබෑම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවිකර ගැනීමට නොහැකි වීම, විදුලි වියදම් වැඩිවීම වැනි කරුණු හේතුවෙන් බොහෝ කර්මාන්ත උපරිම ධාරිතාවයකින් යුතුව කටයුතු කර ගෙන යා නොහැකි මට්ටමකට පත්වී ඇති බැවින් කර්මාන්තශාලාවල සේවක සංඛ්‍යාව අවම කරමින් නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යන බව . | බිහිකිරීමට සැලසුම් කළ රැකියා ප්‍රමාණය කරා ලඟාවීමට කර්මාන්තකරුවන් යොමුකළ යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රයිගම කර්මාන්තපුරයට අදාලව පහත නිරීක්ෂණ කෙරුණි. | | |
| **(i)** 2016 ඔක්තෝම්බර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කර්මාන්ත ක්ෂේත්‍ර 05ක් ස්ථානගත කිරීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙමින් අක්කර 200 ක භූමි ප්‍රමාණයක් තුළ රයිගම කර්මාන්තපුරය පිහිටුවීමට අපේක්ෂා කර තිබුණද කර්මාන්තපුරය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහන් කරමින් ව්‍යාපෘති සැලැස්මක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් කර්මාන්තපුරය සංවර්ධන සඳහා රු.මිලියන 298 ක් වැය කර සංවර්ධන කටයුතු ආරම්භ කර වර්ෂ 07 ක් ගතවී තිබුණද ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | දේශපාලන අධිකාරියේ තීරණ මත කැබිනට් අනුමැතිය යටතේ කඩිනමින් ආරම්භ කල ව්‍යාපෘතියක් බැවින් මෙම කර්මාන්තපුරය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හෝ ව්‍යාපාති සැලැස්මක් සකස් කර නොමැති බවත්, මෙම කර්මාන්තපුරය ආරම්භයේ සිටම දේශපාලන විරෝධතා පැවතීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව නතරකල බව. ඉන් පසුව රටතුල ඇති වූ කොවිඩ් වසංගත තත්වය, දේශපාලන අස්ථාවරභාවය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බව, මේවන විට කර්මාන්තකරුවන් ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භකර කර්මාන්තපුරය සංවර්ධනය කිරීමේ කටයුතු ද ආරම්භකර ඇති බව. | කර්මාන්තපුර සංවර්ධන කටයුතු කඩිනමින් නිමකර කර්මාන්ත ආරම්භ කිරීමට දිරිගැන්වීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරන ගැසට් පත්‍රයේ අඩංගු ජාතික පාරිසරික පනතේ සඳහන් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය වන්නේ හෙක්ටයාර 10 (අක්කර 24) ට වැඩි සංවර්ධන කටයුතු සඳහා පමණක් බවට වන වගන්තිය අනුව කර්මාන්තපුරය තුල පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමේ අවශ්‍යතාවය බැහැර කරමින් අක්කර 200ක් වූ මුළු ඉඩමෙන් අක්කර 24 ක භූමි භාගයක් තුල ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණි. | රයිගම කර්මාන්ත හා තාක්ෂණික සංවර්ධන අධිකලාපය අක්කර 200කින් ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම ඉඩම් කොටස් සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා කාර්මික තාක්ෂණික ආයතනය වෙත රු.969,278 ක මුදලක් ලබාදී ඇතත් කාර්මික තාක්ෂණික ආයතනය විසින් එම කාර්ය සිදු කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කර්මාන්තපුරය අක්කර 24කින් ආරම්භ කිරීමට දේශපාලන අධිකාරිය සහ අමාත්‍යාංශයේ නිලධාරීන් අතර පැවති සාකච්ඡාවලදී තිරණය වී ඇති බව. | කර්මාන්තපුර ආරම්භ කිරීමට පෙර පාරිසරික නීතිවල අවශ්‍යතාවට අනුකූලව කටයුතු කළ යුතුය. පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සඳහා ගෙවූ මුදල ආවරණය / ආපසු අය කර ගත යුතුය. |
| **(iii)** | 2023 දෙසැම්බර් 31 දින වන විට රයිගම කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ගයේ නල එලීමේ කටයුතු සඳහා රු.මිලියන 29.57 ක් හා අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 36.8 ක් වැය කර තිබුණ ද එම කාර්යයන්හි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 70 ක් හා සියයට 40 ක් විය. | අභ්‍යන්තර මාර්ගයේ නල එලීමේ කටයුතු සඳහා රු.මිලියන 29.57ක ඇස්තමේන්තු මුදල ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණ ද, දේශපාලන හේතූන් මත කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු වූ බව. නැවත සංවර්ධන කටයුතු ආරම්භ කිරීමේ දී රටතුල ඇතිව තිබූ ආර්ථික අර්බුදය හේතුවෙන් අමුද්‍රව්‍ය මිල ඉහල යෑම, එකතු කළ අගය මත බද්ද සියයට 8 සිට සියයට 15 දක්වා වැඩිවීම හා යෝජිත ප්‍රවේශ මාර්ගය සඳහා කුඹුරු අත්පත් කර ගැනීම් අවසන් වී නොමැති වීම යන හේතු මත පෙර ලබා දී තිබූ ඇස්තමේන්තුව සංශෝධනය කර තිබූ බව. එම සංශෝධිත ඇස්තමේන්තුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇති බව හා අදාළ අනුමැතිය ලැබීමෙන් පසු මාර්ගයේ සංවර්ධන කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරෙන බව. | කර්මාන්තපුරය සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු කඩිනමින් නිමකර කර්මාන්ත ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| **(iv)** | කර්මාන්තපුරය සඳහා රු.මිලියන 87.96 ක් වැයකර පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද | රයිගම කර්මාන්තපුරය අක්කර 200ක් සඳහා සැලසුම් කරන ලද අතර පරිපාලන ගොඩනැගිල්ල, | කර්මාන්තපුරය සඳහා ඉදිකල පරිපාලන |

| | | | |
|---|---|---|---|
| | වර්තමානය වන විට භාවිතයකින් තොරව වසා දමා තිබුණි. | රජයේ විවිධ පුහුණු වැඩසටහන් සඳහා ලබා දීමට තීරණය කර ඇති බව. 2019 නොවැම්බර් මාසයේ සිදු වූ දේශපාලන පෙරලිය සමඟ ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව නතර කිරීම හේතුවෙන් පරිපාලන ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන්කර නොමැති බව. | ගොඩනැගිල්ලේ කටයුතු නිම කිරීමටත් ඵලදායී ලෙස භාවිතයට ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (v) | කර්මාන්තපුරය සඳහා ආයෝජකයින් තෝරා ගැනීමට 2017 ඔක්තෝබර් මස 02 වන දින පල කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ආයෝජකයින් 194 දෙනෙකුගෙන් අයදුම්පත් ලැබී තිබුණු අතර අයදුම්පත් 42 ක් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව මඟින් ඇගයීම් කර තිබුණි. කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම මත එම තෝරා ගත් ආයෝජකයන් අතරින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණු ආයෝජකයන් 4 දෙනෙකු තම ආයෝජනයන් ඉවත් කරගැනීම හේතුවෙන් රු.මිලියන 1185.4 ක් ආයෝජනය තුළින් රැකියා අවස්ථා 715 ක් කර්මාන්ත ක්ෂේත්‍රයට එකතු කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | 2019 නොවැම්බර් මාසයේ සිදු වූ දේශපාලන පෙරලිය සමඟ කර්මාන්තපුර ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව නතරකල අතර ඉන් පසුව රටතුල ඇති වූ කොවිඩ් වසංගත තත්වය, දේශපාලන අස්ථාවරභාවය, භාණ්ඩ ආනයනය සඳහා තාවකාලිකව පනවා තිබූ සීමාවන් මත කර්මාන්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බැවින් ඇතැම් කර්මාන්තකරුවන් තම ව්‍යාපෘති සිදු නොකරන බව දැනුම් දී ඇති බව හා එම ව්‍යාපෘති බස්නාහිර පළාත් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් අවලංගු කර ඇති බව. | සුදුසු ආයෝජකයින් තෝරා ඉඩම් ලබාදී කර්මාන්ත නැවත ආරම්භ කරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බුත්තල කර්මාන්තපුරය සඳහා ඉඩම් කට්ටි 43 ක් වෙන්කර තිබුණු අතර ඉන් ඉඩම් කට්ටි 38 ක් කර්මාන්තකරුවන් 20 කට ලබා දී තිබුණි. ඉන් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ කර්මාන්තකරුවන් 5ක් පමණක් වන අතර කර්මාන්තකරුවන් 3 ක් ගොඩනැගිලි ඉදිකර තිබුණ ද නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. කර්මාන්තකරුවන් 5 ක් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර කර්මාන්තකරුවන් 7 ක් වෙත වෙන්කර දී තිබුණ පර්චස් 660.13ක් කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර නිශ්කාර්යව පවතී. | කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොතිබුණු කර්මාන්තකරුවන් සම්බන්ධයෙන් ඉදිරියේදි පැවැත්වීමට නියමිත ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව වෙත ඉදිරිපත් කර එහි නිර්දේශ අනුව අවසන් තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | කර්මාන්තකරුවන් විසින් කර්මාන්ත ආරම්භ කිරීමට පෙර ලබා දෙන වැඩ සැලැස්ම අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව නිරතුරුව පසු විපරම් කර ඒ අනුව කටයුතු නොකරන ඉඩම් අත්පත් කරගෙන වෙනත් පාර්ශව වෙත පැවරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | | | |
| (i) | මන්නාරම දිස්ත්‍රික්කයේ | මන්නාරම ප්‍රදේශයේ | කර්මාන්ත සඳහා |

| | | | |
|---|---|---|---|
| | කර්මාන්තපුරයක් ස්ථාපනය කිරීම සඳහා 2010 නොවැම්බර් 09 දින යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ධීවර, කෘෂි හා ආහාර නිෂ්පාදන කර්මාන්තවල ආයෝජන අවස්ථා සැලසීමට අදාල යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අක්කර 24 ක ඉඩම් ප්‍රමාණයක රු.මිලියන 356 ක වියදමක් දරා කර්මාන්තපුරය ඉදිකර වර්ෂ 13 ක් ගත වී තිබුණද මේ දක්වා කර්මාන්ත ආරම්භ කර නොතිබුණු අතර අක්කර 6 ක ඉඩම් ප්‍රමාණයක් භාවිතා කරමින් එක් කර්මාන්තකරුවෙක් පමණක් ඇඟළුම් කර්මාන්තයක් පවත්වා ගෙන යමින් පැවතුණි. | ආයෝජකයින්ගේ ඉල්ලීම පරිදි කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ජලය, විදුලිය, අභ්‍යන්තර මාර්ග පද්ධතිය ආදියෙන් සමන්විතව මන්නාරම කර්මාන්තපුරය ආරම්භ කිරීමට පියවර ගනු ලැබූ අතර ප්‍රදේශයේ පොදු යටිතල පහසුකම් සංවර්ධනය වුවත් කන්කසන්තුරය හා ත්‍රිකුණාමලය යන වරායයන්හි නිමි නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් ප්‍රමාණවත් පරිදි වැඩිදියුණු නොවීම මත නිමි නිෂ්පාදනයන් අලෙවි කිරීමට/ අපනයනය කිරීමට කොළඹ රැගෙන ආ යුතු වීමෙන් ගමනාගමන කටයුතු සඳහා ඉහල වියදමක් දැරීමට සිදුව ඇති බව. මේ හේතුවෙන් මන්නාරම කර්මාන්තපුරයේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා නව ආයෝජකයන් ඉදිරිපත්වීම ඉතාම මන්දගාමීවී ඇති අතර 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පාස්කු ප්‍රහාරය, 2020 වර්ෂයේ ඇති වූ කොරෝනා වසංගත තත්වය, පසු කාලීනව ඇති වූ දේශපාලන අස්ථාවරත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් සහ කර්මාන්තපුර භූමිය තුල වර්ෂා කාලයන්හි දී වැසිජලයෙන් පිරීයාම ද එම තත්වය තවත් උග්‍ර කිරීමට හේතු වී ඇති බව. | වෙන් කර ඇති හා නිෂ්කාර්යව පවතින ඉඩම් ප්‍රමාණය සුදුසු ආයෝජකයන් තෝරා ලබාදීමටත් දරා ඇති අතිවිශාල පිරිවැයට සරිලන ප්‍රතිලාභයක් ලබාගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ii) | කර්මාන්තපුර ස්ථාපනය සඳහා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමේදී එහි ආර්ථික වාසි තක්සේරු කිරීම පිණිස ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට වැයවන මූලික වියදම සලකා බැලීම අවශ්‍ය වුව ද මන්නාරම කර්මාන්තපුරය ස්ථාපිත කිරීමේදී එවැනි කිසිදු අධ්‍යනයක් හෝ තක්සේරුවක් සිදු කර නොතිබුණි. | යුධමය වාතාවරණය, උතරු නැගෙනහිර පළාත් දෙකෙහි සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි ඇතිකර තිබූ දැඩි බලපෑමට ඉක්මන් විසඳුමක් ලෙස ප්‍රදේශයේ ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාකාරකම් උද්දීපනය කරනු වස් ආදායම් උත්පාදන සඳහා ඉහළ හැකියාවක් සහිත කර්මාන්ත අංශයේ දායකත්වය ලබාදීම පිණිස 2010 වර්ෂයේදී මන්නාරම කර්මාන්තපුරය ස්ථාපනය කිරීමට පියවර ගත් බව. | කර්මාන්තපුර ස්ථාපිත කිරීමේදී ශක්‍යතා අධ්‍යයන සිදුකර ආර්ථික වාසි පිළිබඳ හා යටිතල පහසුකම් සඳහා වූ වියදම් පිළිබඳ නිසි තක්සේරුවක් සිදු කළ යුතුය. මන්නාරම කර්මාන්තපුරය සඳහා වන බාධාවන් අධ්‍යනය |

| | | | |
|---|---|---|---|
| | | කර්මාන්තපුරය ස්ථාපනය සඳහා විශේෂ අධ්‍යානයක් නොකලද මහා මාර්ග පද්ධතිය, ජලය, විදුලිය වැනි මූලික යටිතල පහසුකම් කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම රජය විසින් ඒ වන විටත් ගෙන තිබූ ප්‍රමුඛ හා කඩිනම් ක්‍රියාමාර්ග, ප්‍රමාණවත් වූ බව. | කර පිළියම් යෙදීමටත් ආයෝජකයින් දිරිමත් කර කර්මාන්තපුරය ආරම්භ කිරීමටත් කටයුතු කල යුතුය. |
| (ඇ) | සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතනවලින් සිදු කරන ලද ඉහළ ප්‍රමිති තත්ත්වයේ පවතින පර්යේෂණ හා නව නිපැයුම් කර්මාන්තකරුවන් වෙත ඉදිරිපත් කර ඒවා වාණිජකරණය කිරීමේ වැඩසටහනක් 2023 මාර්තු 30 හා 31 දෙදින තුළ පෞද්ගලික හෝටලයක පවත්වා රු.2,469,752 ක මුදලක් වැය කර තිබුණි. එහිදී නව නිපැයුම් හා පර්යේෂණ 6 ක් වාණිජකරනය කිරීම සඳහා කර්මාන්ත ආයතන 6 ක් තම කැමැත්ත පල කර ඇති බව දක්වා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම නව නිපැයුම් වෙළඳපොළට හඳුන්වා දී නොතිබුණි. | මෙම වැඩසටහනේ ප්‍රමුඛ අරමුණ සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව තෝරාගත් පර්යේෂණ හා නව නිපැයුම් කර්මාන්තකරුවන් වෙත ඉදිරිපත් කිරීම තුළින් එම පර්යේෂකයින් / නව නිපැයුම්කරුවන් හා කර්මාන්තකරුවන් අතර සහ සම්බන්ධතාවය ගොඩ නැගීම හා කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන් හඳුනා ගෙන පර්යේෂණ හා නව නිපැයුම් සඳහා උනන්දු කරවීම වූ බව. මෙම වැඩසටහන මගින් වාණිජකරණය කිරීම සඳහා කැමැත්ත පල කරන ලද නව නිපැයුම් හා පර්යේෂණවල වර්තමාන ප්‍රගතිය පිළිබඳව පසු විපරමක් සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | පර්යේෂණ හා නව නිපැයුම් වාණිජකරණය සඳහා කර්මාන්තකරුවන් දිරිමත් කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. එවැනි වැඩපිළිවෙලවල් තෝරා ගැනීමේදී පිරිවැය අවම වීම සහතික විය යුතුය. |
| (ඉ) | නව නිපැයුම් වාණිජකරණය සඳහා සම්මන්ත්‍රණ (Symposium) 3ක් රු.මිලියන 5.55 ක වියදමක් දරා 2023 වර්ෂයේදී පෞද්ගලික හෝටලයක පවත්වා තිබුණි. එහිදී ඉදිරිපත් වූ නව නිපැයුම්කරුවන් 115 ක් අතුරින් නව නිපැයුම් 15 ක් වාණිජකරණය සඳහා හඳුනාගෙන තිබුණද ඉන් 4 ක් පමණක් වාණිජකරණය සඳහා ගිවිසුම් අත්සන් කිරීමට එකඟතාවය පල කර තිබුණු අතර නව නිපයුම් 11ක් සාකච්ඡා මට්ටමේ පැවතුණි. ඒ අනුව ඉදිරිපත් වූ නව නිපැයුම්කරුවන්ගෙන් සියයට 3ක් පමණක් වාණිජකරණය සඳහා ගිවිසුම්ගත වීමට එකඟ වී තිබුණි. | කර්මාන්ත අමාත්‍යාංශය කර්මාන්ත ක්ෂේත්‍රයේ නව නිපැයුම් හා පර්යේෂණ හඳුන්වා දීම පිණිස නව නිපැයුම් වාණිජකරණය සඳහා සම්මන්ත්‍රණ 3ක් රු. මිලියන 5.55 ක වියදමක් දරා 2023 වර්ෂයේදී සිදු කරන ලදී. එහිදී මෙරට පර්යේෂණ ආයතන හා විශ්වවිද්‍යාල මගින් සිදු කර තිබූ එහෙත් වාණිජකරණය වී නොමැති නව නිපැයුම් හා පර්යේෂණ 115ක් කර්මාන්තකරුවන්ට හඳුන්වා දී ඉන් 15ක් වාණිජකරණය සඳහා වූ මූලික අදියරේ සාකච්ඡා එකඟතාවයන් ඇති කර ගනු ලැබූ බව. | සුදුසු නව වැඩපිළිවෙලක් මගින් නව නිපැයුම් වාණිජකරණය කිරීමට කටයුතු කළ යුතුය. එහිදී පිරිවැය අවම වන පරිදි නව නිපැයුම් වානිජකරණ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | බටඅත කර්මාන්තපුරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 105 ක ඉඩම් ප්‍රමාණයක රු.මිලියන 343.41 ක වියදමක් දරා සම් පදම් කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා 1999 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ. | පිළිතුරු සපයා නැත. | අවශ්‍ය පාරිසරික ඇගයීම් සිදු කිරීමෙන් පසු ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |
| **(i)** | මෙම කර්මාන්තපුරයේ අපද්‍රව්‍ය මුහුදට බැහැර කිරීමට යෝජනා වී තිබීම හේතුවෙන් ධීවර ජනතාවගේ විරෝධතා නිසා කර්මාන්තපුරයේ ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. එහිදී ව්‍යාපෘතියේ ආයෝජනය කළ ආයෝජකයින් 6කට 2019 - 2022 කාලය තුළ රු.මිලියන 17.55 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. | | |
| **(ii)** | 2006 පෙබරවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙස නැවත කර්මාන්තපුරය සංවර්ධනය කර කර්මාන්තකරුවන් 23කට ඉඩම් අක්කර 70 රූඩ් 1 පර්චස් 2.3 ක් ලබා දී තිබුණි. එයින් ප්‍රමාණවත් නිෂ්පාදනයක් සිදු කරනු ලබන්නේ ඉඩම් අක්කර 34 රූඩ් 3 ක් ලබාගත් කර්මාන්තකරුවන් 10ක් පමණක් වූ බැවින් කර්මාන්තපුරයට වෙන්කළ ඉඩම් අක්කර 105 න් පොදු පහසුකම් සඳහා වෙන්කළ අක්කර 9 රූඩ් 3 හැර ඉතිරි ප්‍රමාණයෙන් අක්කර 60 කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුණි. | බටඅත කර්මාන්තපුරය අක්කර 105කින් සමන්විත වුවත් එහි සංවර්ධනය කර ඇත්තේ අක්කර 70 කට ආසන්න ප්‍රමාණයක් බවත් සංවර්ධනය නොකල ඉඩම් කොටස්ද මේවන විට කර්මාන්තකරුවන්ට වෙන්කර ඇති නමුත් අක්කර 12ක පමණ බිම් ප්‍රමාණයක් සංවර්ධනය කල යුතුව ඇති බව. | කර්මාන්ත සඳහා යෝජිත හා නිෂ්කාර්යව පවතින ඉඩම් ප්‍රමාණය සුදුසු ආයෝජකයන් වෙත ලබාදීමටත් සංවර්ධනය කරන ලද ඉඩම්වලින් ප්‍රයෝජන ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| **(iii)** | බටඅත කර්මාන්තපුරය සඳහා රු.මිලියන 31.66ක් වැය කර ඉදි කරන ලද පරිපාලන ගොඩනැගිල්ල වර්තමානය වන විට නිෂ්කාර්යව පැවතුණි. | 1999 වර්ෂයේදී කර්මාන්තපුරයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකර ඇතත් කර්මාන්තපුරය අවට ධීවර ජනතාවගේ විරෝධතාවය මෙන්ම ප්‍රාදේශීය දේශපාලනික බලපෑම් ද හේතුවෙන් එම ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට සිදුවූ බව. 2006 පෙබරවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | ගොඩනැගිල්ල පරිහරණයට නුසුදුසු වන්නේ නම් ඒ බව තහවුරු කරගෙන සුදුසු ක්‍රමවේදයකට අපහරනය සඳහා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අනුව මෙම කර්මාන්තපුරය තුළ මිශ්‍ර ආයෝජන ක්‍රියාත්මක කිරීම සඳහා සියළු යටිතල පහසුකම් සම්පූර්ණ කරන ලද බව. ඒ අනුව පරිපාලන ගොඩනැගිල්ල 2011 වර්ෂයේ සිට එක් කර්මාන්තකරුවකුගේ සේවකයන්ගේ පරිහරණය සඳහා ලබා දී ඇතත් මේ වන විට ඉතා අබලන් තත්වයේ පවතින ගොඩනැගිල්ල ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොටගේ තාක්ෂණික වාර්තාව අනුව පරිහරණයට නුසුදුසු බැවින් 2021නොවැම්බර් 30 දින සිට වසා දමා ඇත. | |

**3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්තපුර සංවර්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1,000 ක් ඇස්තමේන්තුකර ප්‍රතිපාදනය කර තිබූ අතර වියදම රු.මිලියන 880 ක් විය. ඉන් කර්මාන්තපුර 9 ක සංවර්ධන කටයුතු 19 ක් වෙනුවෙන් මුළු ඇස්තමේන්තුගත වියදම වන රු.මිලියන 489.55 ක් එකවර ගෙවා තිබුණද එම කාර්යයන්හි ප්‍රගතිය සියයට 0 ක් විය. දඹුල්ල කර්මාන්තපුරයේ වැට හා ගේට්ටුව ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම වන රු.මිලියන 14.96 එකවර ගෙවා තිබුණද එහි ප්‍රගතිය සියයට 15 ක් වී තිබුණි. | අළුතැපොල. දඹුල්ල, සූරියවැව, නොච්චියාගම, කටුනායක, රයිගම, පුත්තලම, නාලන්ද මාතලේ හා කහටගහ ග්‍රැෆයිට් යන කර්මාන්තපුරවල සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින බව. | සංවර්ධන වියදම් සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුගත මුලු වියදම එකවර නොගෙවිය යුතු අතර භෞතික ප්‍රගතිය සලකා බලා ගෙවීම් කළ යුතුය. ගෙවීම් කළ මුදලට අදාල කාර්යයන් ඉටුකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර **5** කට ආසන්න කාලයක සිට අලුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට යොමු කර තිබූ වාහනයක් අලුත්වැඩියාවන් සිදුකර ධාවනයට එක්කර නොතිබුණි. | මෙම වාහනයේ වර්ගය හා මාදිලිය අනුව අමතර කොටස් සපයා ගැනීම හා අලුත්වැඩියා කිරීම සඳහා අධික වියදමක් දැරීමට සිදු වන අතර වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් | නොපමාව වාහනය අළුත්වැඩියා කර ධාවනයට එක්කර ගැනීමටත් අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් |

| | | | |
|---|---|---|---|
| | | අලුත්වැඩියාව සිදු කිරීමට නොහැකි වී ඇති බව. මෙම වාහනයට අලාභ හානි සිදු කිරීම සම්බන්ධව වගකිව යුතු සිමෙන්ති සමාගමේ හිටපු සභාපතිට විරුද්ධව කොල්ලුපිටිය පොලීසිය මගින් නඩු ගොනු කර අලාභය අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බව. | අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.මිලියන 6 ක් වූ වාහනයක් 2019 අප්‍රේල් 11 දින අනතුරට ලක් වී තිබුණු අතර අළුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික ආයතන දෙකක වර්ෂ 5කට ආසන්න කාලයක් රඳවා තබා තිබී කිසිඳු අළුත්වැඩියා කිරීමකින් තොරව 2023 සැප්තැම්බර් මාසයේදී නැවත අමාත්‍යාංශයට රැගෙනවිත් අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබුණි. | 2019 අප්‍රේල් 11 දින හදිසි අනතුරකට ලක්වූ වාහනයේ අලුත්වැඩියාව සඳහා පුද්ගලික ගරාජයක් විසින් ලබා දුන් ඇස්තමේන්තු සඳහා රක්ෂණ සමාගම අනුමැතිය ලබා නොදීම හේතුවෙන් 2023 වර්ෂය වන විටත් වාහනය අලුත්වැඩියා කිරීමට නොහැකි වූ බව. අමාත්‍යාංශයේ වාහාන අපහරණ කමිටුව වෙත මෙම වාහනයද ඉදිරිපත් කරන ලද අතර එහිදී වාහනය රක්ෂණ සමාගම වෙත පවරාගෙන අමාත්‍යාංශයට ලබා දෙන මුදලේ වටිනාකම හෝ Cash in Lieu යටතේ ලැබෙන මුදල හා වාහනය අපහරණය කිරීම මගින් ලැබෙන මුදලේ වටිනාකම යන අවස්ථා දෙකෙන් රජයට වාසිදායක ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කමිටුව තීරණය කර ඇති බව. රක්ෂණ සමාගම විසින් වාහනය පවරාගෙන ගෙවීමට එකඟවන වටිනාකම අමාත්‍යාංශය වෙත දැනුම් දෙන තෙක් වාහන අපහරණය කිරීම ප්‍රමාද වූ බව. | කඩිනමින් වාහනය අළුත්වැඩියා කටයුතු අවසන් කර ධාවනයට එක්කර ගෙන අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ අපහරණය මගින් මුදල් ලබාගැනීම යන දෙකෙන් වඩාත් වාසිදායක තීරණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හිටපු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා විසින් භාවිතා කරන ලද වාහනයක් 2022 මැයි 09 දින අනතුරකට ලක් වී තිබුණු අතර අලුත්වැඩියා කිරීම සඳහා එහි නියෝජිත ආයතනය විසින් රු.3,969,455 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ නමුත් රක්ෂණ ආයතනය විසින් රු.2,600,000ක මුදලක් පමණක් වන්දි ලෙස අනුමත කර තිබුණි. 2022 ජූලි 21 දින සිට, කිසිඳු අලුත්වැඩියා කිරීමකින් තොරව | වාහනය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | කඩිනමින් අළුත්වැඩියාවන් සිදු කර වාහනය ධාවනයට එක් කළ යුතු අතර අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

මෙම රථය නියෝජිත ආයතනයේ රඳවා තිබුණි.

**3.7 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගළුම් නිෂ්පාදන හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ආරක්ෂක නිල රථය ලෙස භාවිතා කර තිබුණු වාහනය 2021 ජනවාරි 13 දින සිදු වූ හදිසි රිය අනතුරකින් හානියට පත් වී තිබුණු අතර එම අවස්ථාවේ රියදුරු විසින් අනතුර පිළිබඳ රක්ෂණ ආයතනය හා පොලිසිය වෙත දැනුම් දී නොතිබුණි. රු.1,323,900 ක් වූ වාහන අළුත්වැඩියා වියදමින් රක්ෂණ වන්දිය වශයෙන් ලද රු.200,000 අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල වන රු.1,123,900 ක් අමාත්‍යාංශයෙන් ගෙවා තිබුණි. ඒ අනුව මෙම වාහන අනතුරෙන් සිදු වූ රු.1,123,900ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | වාහනයට සිදුවූ අලාභය අය කර ගැනීම සඳහා නීති ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර නීති නිලධාරී විසින් අදාළ ලේඛන නීතිපති වෙත යවා ඇති අතර නඩු පැවරීමේ කාර්යයන් සිදු කරමින් පවතින බව. | අනතුරක් වූ වහාම ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට රියදුරන් වෙත උපදෙස් ලබා දිය යුතුය. අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ රු.මිලියන 4.5ක ප්‍රතිපාදන සලසා තිබුණු දේශීය රතු මැටි උළු නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම සඳහා වූ ව්‍යාපෘතිය තුළින් කර්මාන්තකරුවන් 30 දෙනෙක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මූලික සහතිකකරණ ගාස්තුවෙන් සියයට 50 ක් එක් ආයතනයක් සඳහා උපරිමය රු.150,000 කට යටත්ව අමාත්‍යාංශය විසින් දැරීමට සැලසුම් කර තිබුණි. කර්මාන්තකරුවන් 10 දෙනෙකු මේ සඳහා අයදුම් කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එක් කර්මාන්තකරුවෙකු හෝ ප්‍රමිති සහතිකය ලබා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර මෙම මූල්‍ය සහනය ලබා | මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණද කර්මාන්ත ආයතන සඳහා ප්‍රමිති ලබා ගැනීමේ කාර්යය ආරම්භ කිරීම ප්‍රමාද විය. සමස්ථ ලංකා මැටි සෙවිළි උළු නිෂ්පාදකයින්ගේ සංගමයෙහි සහයෝගය ඇතුව, වඩාත්ම සුදුසු කර්මාන්තශාලා කිහිපයක් තෝරා ගනිමින් මෙම ඉතිරි වී ඇති මුදල් එම කර්මාන්ත ශාලා සඳහා ප්‍රමිති සහතික ලබා ගැනීමේ කාර්යයට මෙම වසර තුලදී යොදා ගැනීමට සැලසුම් කර ඇති බව. | මූලික කටයුතු ඉටුකිරීමෙන් පසු ප්‍රතිපාදන ඇස්තමේන්තු කිරීමට කටයුතු කල යුතු අතර සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙන නොතිබුණි. | | |
| (ආ) | කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී ඉඩම වෙන් කිරීමෙන් පසුව අවුරුදු 35 ක දීර්ඝකාලීන බදු ගිවිසුමක් අත්සන් කල යුතු වුවද කර්මාන්තපුර 25 ක කර්මාන්තකරුවන් 322ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | කර්මාන්තපුරවලින් ඉඩම් වෙන් කර දී ඇති, එහෙත් බදු ගිවිසුම් තවමත් සකස්වී නොමැති ආයෝජකයින්ට දීර්ඝ කාලීන බදු ඔප්පු ලබා දීම කඩිනම් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කර්මාන්තපුර මට්ටමින් ජංගම සේවාවන් පැවැත්වීම 2021 වර්ෂයේදී ආරම්භ කර ඇත.ඒ අනුව 2022 හා 2023 වර්ෂයන්හීදි ජංගම සේවාවන් 13ක් පවත්වා ඇති බව. | කර්මාන්තකරුවන් සඳහා දීර්ඝකාලීන බදු ගිවිසුම් ලබාදීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය.<br>ඉඩම් වෙන් කිරීමට ප්‍රථම දීර්ඝකාලීන බදු ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කරගත යුතුය. |
| (ඇ) | කර්මාන්තපුර 13 කට අදාළව කර්මාන්තකරුවන් 107 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු.205,230,683 ක් විය. | බදු ගිවිසුම් සකස් කිරීම හා බදු මුදල් එකතු කිරීමේ වගකීම සෘජුව ඉඩම අයත් ආයතනය (ප්‍රාදේශීය ලේකම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මහවැලි අධිකාරිය) සතු වේ. කර්මාන්තකරුවන් බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාල ආයතනවලට දන්වා ඇති බව. | බදු මුදල් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු කළ යුතුය. |
| (ඈ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේම දැනට ස්ථාපිත කර තිබෙන බටඅත කර්මාන්තපුරයේ අක්කර 60කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් ඌන උපයෝජිතව පවතින අතර ඊට ආසන්නව සූරියවැව අක්කර 20 ක ඉඩමක කර්මාන්තපුරයක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 252.7 මුදලක් වැය කිරීම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම කර්මාන්තපුරය 2022 ජාතික අයවැය යෝජනාව තුළින් ප්‍රකාශයට පත්කල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් අක්කර 105 කින් යුතු බටඅත කර්මාන්තපුරයේ මේ වන විට හිස් බිම් කොටස් ඇති නමුත් මෙහි ආහාර නිෂ්පාදන කර්මාන්ත 2ක් ඇතුළුව ලෙඩ්-ඇසිඩ් බැටරි, සිමෙන්ති, වානේ, කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන යන කර්මාන්ත ස්ථාන ගත කොට ඇති බව. මෙම කර්මාන්තපුරය සඳහා ආහාර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත කිරීමට යෝජිත සූරියවැව කර්මාන්තපුරය යොදා ගැනීමට නියමිත බවත් දක්ෂිණ අධිවේගී මාර්ගයට ඉතාමත් ලඟින් පිහිටා තිබීමද වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපලද මෙම ස්ථානයට ආසන්නව පිහිටා තිබීම නිසා ඉදිරියේදී මෙම ඉඩමෙහි ආයෝජන අවස්ථා පුළුල් විය හැකි බවට | සැලසුම් කර ආරම්භකර ඇති කර්මාන්තපුර තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නිරීක්ෂණය කරමින් ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාගැනීම මෙම කර්මාන්තපුරය ස්ථාපනය කිරීමට හේතු වූ බව. | |
| (ඉ) | ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ හා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව නාලන්ද එල්ලාවල කර්මාන්තපුර අදියර I හි කර්මාන්තකරුවෙකු ඉඩම් අක්කර 1 ක් තුළ වර්ෂ 24 කට ආසන්න කාලයක් අනවසරයෙන් රැඳී සිටී. කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අවසර ලබාදෙන නිෂ්පාදන කටයුතු සිදුකළ යුතු වුවද කර්මාන්තකරුවන් දෙදෙනෙකු අමාත්‍ය මණ්ඩල තීරණයන්ට පටහැනිව දීර්ඝ කාලයක් තුළ නිෂ්පාදන කටයුතු සිදු නොකර භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි. | ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව මෙම ව්‍යාපෘතිය නිර්දේශ කරන ලද බවත් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා මෙතෙක් ඇගයීම් කමිටුව වෙත යොමු කර නොමැති බව. දැනට සේවකයින් 20 දෙනෙක් පමණ සේවයේ නිරත වන අතර සාර්ථකව නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන ආයතනයක් බව. | ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ හා අමාත්‍ය මණ්ඩලයේ නිසි අනුමැතිය මත පමණක් කර්මාන්තපුර වලින් ආයෝජකයින්ට ඉඩම් වෙන්කර දීමට කටයුතු කළ යුතුය. අනවසරයෙන් රැඳී සිටින කර්මාන්තකරු සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතු අතර අනුමත කාර්යයන් පමණක් ඉටුකිරීමට කර්මාන්තකරුවන් යොමු කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ ගිරාදුරුකෝට්ටේ, දිඹුලාගල, දික්වැල්ල හා ත්‍රිකුණාමලය අදියර III යන කර්මාන්තපුර 4ක ඉඩම් මැනුම් කර ගැනීම, එළිපෙහෙලි කිරීම හා ඉඩම් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම වැනි කටයුතු සඳහා රු.3,266,558 ක් 2022 වර්ෂයේ වියදම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | මෙම නව කර්මාන්තපුර 3 සඳහා 2022 අයවැය තුළින් රු. මි. 5000ක් වෙන් වුවද රට තුල ඇති වූ දේශපාලන අස්ථාවරත්වය, ආර්ථික අර්බුදය හේතුවෙන් රජය විසින් සංවර්ධන කාර්යයන් සඳහා මුදල් නිදහස් කිරීම දැඩි සමාලෝචනයකට ලක් කෙරුණු බව. ඒ අනුව නිදහස් වූ සීමිත ප්‍රතිපාදන යොදා ගනිමින් ඒ වන විටත් සංවර්ධන කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් නිම කරනු ලැබ ඇති කර්මාන්තපුරවල කටයුතු පමණක් මුළුමනින් නිම කිරීමට අමාත්‍යාංශය ගත් තීරණයත් සමඟ මෙම කර්මාන්තපුර 3හි සංවර්ධන කටයුතු තාවකාලිකව නතර කරන ලද බව හා අයවැය මගින් වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව හා ප්‍රමුඛතාවය අනුව ඉදිරියේදී මෙම කර්මාන්තපුර 3හි සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිත බව. | කර්මාන්තපුර සංවර්ධන කටයුතු ප්‍රමුඛතා පදනම මත හෝ ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා විදාතා අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 1798 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 1690 ක් විය. ඒ අනුව පුරප්පාඩු 134 ක්ද අතිරික්ත 26 ක්ද නිරීක්ෂණය විය. | අංක 2289/43 සහ 2022 ජුලි 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශවල අනුමත කාර්ය මණ්ඩලය කර්මාන්ත අමාත්‍යාංශයට අනුයුක්ත විමත් සමඟ සමහර තනතුරු අතිරික්ත වූ අතර ඒ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බව. | අමාත්‍යාංශයේ කාර්යභාරය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හා ඒ අනුව වන පුරප්පාඩු පිරවීමට හා අතිරික්තතා සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |